| 3 වන වාර පරීක්ෂණය - 2009 | |
|---|---|
| | |
| **පෙරදිග සංගීතය** | **කාලය පැය 2 යි** |
| නම:.................................................................... ශ්‍රේණිය............... අංකය................. | |

- **සැළකිය යුතුයි : මකන දියර භාවිතය සම්පූර්ණයෙන් තහනම් වේ.**
- **ඉතාම නිවැරදි පිළතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- **බහුවරණ ප්‍රශ්ණ 20 කින් සමන්විතවේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් ලකුණු 40 කි.**

## I කොටස

1) ස්වරයකට යටින් ඉරක් ගැසීමෙන් හඳුනා ගත හැකි ස්වර විශේෂය වන්නේ,
   1. මන්ද්‍ර ස්වර.
   2. ශුද්ධ ස්වර.
   3. කෝමල ස්වර.
   4. තිව්‍ර ස්වර.

2) සුළගේ ආධාරයෙන් හඬ නිපදවා ගතහැකි සංගිත භාණ්ඩයක් වන්නේ,
   1. බටනලාව. 2. වයලීනය. 3. සිතාරය. 4. තබ්ලාව.

3) වයලීනය හිමි ප්‍රධාන තත් ගණාන වන්නේ,
   1. 3 කි. 2. 2 කි. 3. 5 කි. 4. 4 කි.

4) පංචමයට වඩා ඉහල හඬක් ඇති ස්වරයක් වන්නේ,
   1. ග වේ. 2. ම වේ. 3. ප වේ. 4. රි වේ.

5) ජාතික ගීයේ නිර්මාතෘ වරයා වන්නේ,
   1. ආනන්ද සමරකෝන් මහතා.
   2. සුනිල් ශාන්ත මහතා.
   3. ලයනල් අල්ගම මහතා.
   4. එදිරිවීර සරත්චන්ද්‍ර මහතා.

6) “කුමටද සොබනියේ කඳුලු සලන්නේ ” යන ගීතය ඇතුලත් නාට්‍ය වන්නේ,
   1. මනමේ.
   2. සිංහබාහු.
   3. නරිබෑනා.
   4. සුදුරෙදි හොරු.

7) සප්තකයේ ඇති කෝමල ස්වර ගණාන වන්නේ,
   1. 3 යි. 2. 2 යි. 3. 6 යි. 4. 4 යි.

8) ගුරු අකුරකට හිමි ලඝු මාත්‍රා ගණාන වන්නේ,
   1. 2 යි. 2. 4 යි. 3. 5 යි. 4. 1 යි.

9) දේශීය ජන ගී වලදී කෙළි ගී අයත් වන්නේ,

1. සමාජීය ගී.  2. බැති ගී.  3. මෙහෙ ගී.  4. නැළවිලි ගී.

- **නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| A | B |
| --- | --- |
| 10) ජන ගන මන අධිනායක ජයහෙ | ශුද්ධ ස්වර ස්ථාපන ගීතයකි |
| 11) ගැටීමෙන් හඬ නිපදවන සංගිත භාණ්ඩයකි | ඉන්දියානු ජාතික ගීතය වේ |
| 12) පොත පත කියවා ගීතය | කළගෙඩි කවියකි |
| 13) මුනිසිරි පාදේ ගීතය | ළමා ගීතයකි |
| 14) උහසට පිඹිනා එරන් කලේය | කෝමළ ස්වර ස්ථාපන ගීතයකි |
| 15) නිල් අහස් තලේ අගේ යන ගීතය | තාලම්පට |

- **හිස්තැන් පුරවන්න.**

**16)** ස රි ග, ..............., ග ම ප, ම ප ධ, ................, ධ නි ස

**17)** 0 0 0 මෙම තාල රටාවෙන් මාත්‍රා ........................................................ රිද්ම රටාව පෙන්නුම් කෙරේ.

**18)** X - - / ............................. /x - - / x - -

**19)** අවුරුදු සමයේ අපට ඇසෙන ගී විශේෂය වන්නේ

............................................................................................... .

**20)** තම්මැට්ටම ....................................................... ආධාරයෙන් හඬ නිපදවනු ලබති.

## II කොටස

- **පහත සඳහන් ප්‍රශ්න වලින් හතරක් තෝරාගෙන පිළිතුරු සපයන්න.**

1) I. සප්තකයට අයත් ස්වර ලියන්න. (ලකුණු 7)
II. මධ්‍යමය හා පංචමය අතර ඇති ස්වරයක් නම් කරන්න. (ලකුණු 1)
III. ස රි ග ම ප ධ නි යන ස්වර අපරදිග ස්වර සංඛේත වලින් ලියන්න. (ලකුණු 7)

2) "චා ගමදෝනි නම් පංකාදුයි මෙහෙම ලස්සන මනුෂ්‍ය දුවක් මං නම් දැකලා නෑ"
I. මේ දෙබස අඩංගු නාට්‍යයේ නම ලියන්න. (ලකුණු 2)
II. මෙම දෙබස් කණ්ඩය කවුරුන් විසින් කියන ලද්දෙක්ද ? (ලකුණු 4)
III. මෙම නාට්‍යයේ ගමදුව ගයන ගීතය ලියන්න. (ලකුණු 9)

3) I. ශුද්ධ ස්වර ස්ථාපන ගීතය ගීත ප්‍රස්ථාරය ලියන්න. (ලකුණු 10)
II. එම ගීතය වැයීමට සුදුස තාල වාද්‍ය භාණ්ඩයේ නම ලියන්න. (ලකුණු 5)

4) I. ජන ක්‍රීඩා ආශ්‍රිත කෙළි ගී වර්ග දෙකක නම් ලියන්න. (ලකුණු 5)
II. ඉහත ඉන් එක් කෙළි ගී වර්ගයකට අයත් ගීතයක් ලියන්න. (ලකුණු 10)

5) I. ස්වර පුවරු සංගිත භාණ්ඩයක් ඇඳ එහි ආරෝහන, අවරෝහන ලකුණු කරන්න. (ලකුණු 9)
II. ස රි ග ම ප ධ නි යන වාදනයේදී දකුණතෙහි ඇඟිලි තබන ආකාරය අංක කර දක්වන්න. (ලකුණු 6)

6) I. ඔබ කැමති ළමා ගීතයක් ලියන්න. (ලකුණු 10)
II. එය වාදනය කිරීමට සුදුසු සංගිත භාණ්ඩයක නම ලියන්න. (ලකුණු 5)